www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**භූ චලනයේ සිට හයමාසයක්**

# ඇමරිකානු අධිරාජ්‍යවාදය සහ හයිටි ව්‍යසනය

**American imperialism and the Haitian catastrophe**

**2010 ජූලි 13**

ව්‍යසනයට පත් රට පුනරුත්ථාපනය කිරීමේ හෝ නව ශතවර්ෂයේ නරක ම ස්වාභාවික ව්‍යසනය මගින් නිවාස අහිමි කල මිලියන 1.5ක ජනතාවට නිවාස යලි ලබාදීමේ කිසිදු ප්‍රගතියක් ඇතිවී නැති බව පිලිගත් මාධ්‍ය ආවරන මධ්‍යයේ හයිටියේ බොහෝ ප්‍රදේශ විනාශ කල භූචලනයේ හයමස් සමරුව 12 දිනට යෙදී තිබුනි.

එක්සත් ජනපද ආන්ඩුව කලේ සැමරුම පිලිබඳව උඩින් පල්ලෙන් සඳහන් කිරීම පමනක් ය. එක්සත් ජනපදයේ සංචාරයක නිරත හිස්පැනියෝලා දිවයිනේ පංගුවක් හිමිකරගෙන සිටින ඩොමිනිකානු ජනරජයේ ජනාධිපතිවරයා සමග පැවති කෙටි මාධ්‍ය හමුවක දී ඔබාමා හයිටි පිලිබඳව ආවාට ගියාට සඳහන් කලේ ය.

විස්මයජනක ජීවිත හානි හා නො කඩවා පවතින මිනිසුන්ගේ දුක් වේදනා පිලිබඳ ඔබාමාගේ නො තැකීම පෙන්නුම් කරමින් ඔහු භූචලනයේ පටන් හයිටියේ සංචාරය කොට නැත. ගුවන් හමුදා යානයක කරන කෙටි ගමනකින් රටට ලඟාවිය හැකි අතර එම රට ජනාධිපතිවරනයට අරමුදල් රැස්කිරීම සඳහා රාත්‍රී භෝජන සංග්‍රහයන්ට සහභාගී වීමට දැන් ඩිමොක්‍රටික් ජනාධිපති ඔබාමා රට පුරා කරක් ගැසූ බොහෝ තැන්වලට වඩා වොෂින්ටනයට සමීප ය.

භූචලනයෙන් ක්ෂනික ඉක්බිත්තේ පෝටෝ- ප්‍රින්ස් අගනුවර මූලික මර්මස්ථානවල පාලනය අල්ලාගැනීමට ඔබාමා පරිපාලනය සොල්දාදුවන් සහ නාවික භටයන් 12,000ක් බලමුලු ගැන්වී ය. සහනසේවා කටයුතුවලට පහසුකම් සපයනවාට වඩා ඒවාට බාධාවක් වූ මෙම මිලිටරි ආක්‍රමනය අවසන් කරන ලද්දේ රටෙහි රූකඩ ජනාධිපති රෙනේ ප්‍රේවාල් සහ හයිටි මිලියනපතියන්ගේ කුඩා ප්‍රභූතන්ත්‍රයට එරෙහිව මහජන නැගිටීමක් සිදු නො වන බවට වොෂින්ටනය ඒත්තු ගැනීමෙන් පසුව ය.

අත්ලාන්තික් කුනාටු සමය ආරම්භ වන බවට ප්‍රකාශිත දිනය වන ජූනි 1 දා අවසන් එක්සත් ජනපද ප්‍රහාරක බලඇනිය ආපසු ගැනීම සංකේතාත්මක අහඹුවකට වැඩි යමක් පෙන්නුම් කරයි. කුනාටුවකට මුහුන දිය නො හැකි තවමත් කූඩාරම්වල ජීවත්වන මිලියන 1.5 සහ අබලන් පැල්පත්වල ජීවත්වන තවත් මිලියන ගනනක් ඇතුලු හයිටි ජනතාව ඔවුන්ගේ ම ඉරනමට අතහැර දමා ඇත.

එක් ප්‍රවීන සහනසේවකයෙක් පෝටෝ-ප්‍රින්ස්හි පොඩිපට්ටම් වී ගිය යෝධ කොන්ක්‍රීට් සුන්බුන් හා මිලිටරි සැපයුම් කටයුතු සඳහා එක්සත් ජනපද මිලිටරිය රටට ගෙනෙන ලද යෝධ උපකරන සිය මූලික ප්‍රවේශ මධ්‍යස්ථාන වන වරාය සහ ගුවන් තොටුපොල හැර වෙන කොතැනක හෝ ශුද්ධ පවිත්‍ර කිරීමට යොදා නොගෙනම ආපසු ගෙනයාම අතර වෙනස අවධානයට ලක් කලේ ය. ඒ අතර ම ව්‍යසනයෙන් නිවාස හා රැකියා අහිමිවූ අයගේ ප්‍රධාන කටයුත්ත වී ඇත්තේ වීල්බැරෝ යොදාගෙන අතින් සුන්බුන් ඉවත් කිරීම යි.

ලෝක සමාජවාදී වෙබ් අඩවිය පැහැදිලි කොට ඇති ආකාරයට හයිටියට සිදු වී ඇත්තේ ස්වාභාවික මෙන් ම සමාජීය ව්‍යසනයකි. භූචලනයට කලකට පෙර සිටම අවම ඒක පුද්ගල දල දේශීය නිෂ්පාදිතය, අවම ආයු කාලය, අවම සාක්ෂරතා මට්ටම, සහ අනාගතය පිලිබඳ බාල පරම්පරාවට අඳුරුම බලාපොරොත්තු පැවති හයිටිය බටහිර අර්ධගෝලයේ දිලිඳු ම රට විය. එම දිලිඳුභාවය "ස්වභාව ධර්මයේ" නොව හයිටියේ දීර්ඝකාලීන යටත් විජිත සහ අර්ධ යටත් විජිත ඉතිහාසයේ නිෂ්පාදිතය විය.

ස්වභාව ධර්මය හයිටියට නිවර්තන දේශගුනයක් සහ සාරවත් පසක් උරුම කොට දී තිබේ. වහල් ජනතාව කැරලිගසා ප්‍රන්ස වහල් හිමියන් පලවාහරිමින් 1803 වසරේ නිදහස ලබාගත් ශ්‍රේෂ්ඨ විප්ලවය අවධියේ දී එරට ඒක පුද්ගල මට්ටමින් එක්සත් ජනපදය මෙන් ම සෞභාග්‍යමත් විය. එහෙත්, විදේශ ආර්ථික ආධිපත්‍යය සහ විශේෂයෙන් ම පසුගිය ශතවර්ෂයේ ආර්ථිකමය සහ දේශපාලනිකව වොෂින්ටනය සමග සමීප සබඳතා පවත්වා ගනිමින් සූරාකෑමේ යෙදෙන කෲර පාලන තන්ත්‍රයක දූර්පාලනයෙන් ශතවර්ෂ දෙකක් පුරා හයිටි ජනයා පීඩාවට පත්කරනු ලැබ ඇත.

පසුගිය වසර 100 ක කාලපරිච්ඡේදය තුල එක දිගට වසර 25කට ආසන්න කාලයක් හයිටිය වාඩිලාගත් එක්සත් ජනපදය 1914, 1915-1934, 1994-95, 2004 සහ 2010 වශයෙන් පස්වතාවක් එරටට මිලිටරිය මැදිහත් කර ඇත. දීර්ග වාඩිලාගැනීමක නිරතවූ 1915-34 කාලසීමාවෙන් පසුව තමන් විසින් පුහුනු කල හයිටි ජනතාවට එරෙහිව තුවක්කු අමෝරාගත් මිලිටරියේ

බලය යටතේ ඩුවෙලියර් පවුලේ 30 වසරක ආඥාදායක පාලනයට ඉඩදී එක්සත් ජනපදය එරට හැර ගියේ ය.

ඩුවෙලියර් තන්ත්‍රය බිඳවැටී ගෙවුනු වසර 23 තුල ආන්ඩු මාරුකිරීමට සහ රටෙහි කෘෂිකාර්මික සහ නිෂ්පාදන පදනම විනාශ කරමින් එක්සත් ජනපද සමාගම්වල අවශ්‍යතාවන්ට සේවය සැලසෙන ආර්ථික පිලිවෙත් පැටවීම සඳහා යලි යලිත් එක්සත් ජනපදය එරටට මැදිහත්වී තිබේ. වියයුතු පරිදිම ඉරාකය සහ ඇෆ්ගනිස්ථානය පසෙකින් තැබුවහොත් ලෝකයේ වෙනත් කිසිම රටක් හයිටිය තරම් වොෂින්ටනයේ ආක්‍රමනයට කඩාකප්පල් කිරීමට හා ආර්ථික ආධිපත්‍යයේ කොල්ලයට හසුව නැත.

එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ ඊනියා පුනරුත්ථාපනයේ ව්‍යායාමය තුල මෙම සබඳතාව නො කඩවා ක්‍රියාත්මක වේ. හයිටිය යලි ගොඩනැගීම සඳහා පොරොන්දු වූ ඩොලර් බිලියන 5.3 පාවිච්චි කිරීම අධීක්ෂනය කිරීමට මාර්තුවේ පිහිටැවුනු කොමිසමේ සම-සභාපතිත්වය හයිටි අගමැති ජීන්-මැක්ස් බෙලරිව් විසින් දරනු ලැබුව ද සැබෑ බලය රැඳී තිබෙන්නේ හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන් සහ ඔබාමා පරිපාලනය ඇතුලත් ඇමරිකානු සම-සභාපතිත්වයේ අතෙහි ය.

මූනිච්ඡාවට හයිටිය ද සහභාගි කරගෙන තිබුනත් ආධාර මුදල් භාවිතා කිරීමේ පාලනය පවතින්නේ වොෂින්ටනය සතුව ය. භූචලනය සිදු වී මාස පහකට වැඩි කාලයක් ගතවීමෙන් පසුව ජුනි 17 දා කොමිසම රැස්වූයේ ජනගහනයේ ඉතා කුඩා සුලුතරයකට පමනක් කූනාටු ආවරන ගොඩනැගීමේ ව්‍යාපෘතීන්ට හුදු ඩොලර් මිලියන 31ක සොච්චම් මුදලක් අනුමත කිරීමටය. කූනාටු සෘතුව ආරම්භ වීම නිසා එය අවශ්‍යව තිබුනි.

තම ප්‍රධාන ඉලක්කය වන්නේ හයිටිය තුල පුද්ගලික ආයෝජන දිරිගැන්වීම බව හිටපු ජනාධිපති ක්ලින්ටන් නැවත නැවතත් ප්‍රකාශ කොට ඇති අතර ඒ සඳහා ඔහු එක්සත් ජනපදයේ සහ අනෙකුත් අධිරාජ්‍යවාදී බලවතුන්ගේ බැංකු සහ සංගතවල ලාභ සහතික කර දීමට අවශ්‍ය කරන පිලිවෙත් ක්‍රමානුකූලව දිරිගන්වා තිබේ.

"කෘෂිකර්මාන්තය, ගොඩනැගිලි ඉදිකිරීම, සංචාරක ක්ෂේත්‍රය, නිෂ්පාදනය, සේවා කර්මාන්ත විශේෂයෙන් ම සූර්ය බලය ඇතුලත් පිරිසිදු බලශක්ති කර්මාන්ත ආදී දීර්ඝකාලීන ලාභදායක අංශ සමගින් ආයෝජන සඳහා අවස්ථාවන් තිබේ" යයි මේ සති අන්තයේ අගමැති බෙලරිව් සමඟ පෙනී සිටිමින් නිව් යෝක් *ටයිම්ස්හි* තීරුලිපියකට ක්ලින්ටන් ප්‍රකාශ කර තිබේ.

මෙම පීඩිත සහ වේදනාවට පත් රට යලි ගොඩනැගීම හදිසි මානුෂික කර්තව්‍යයක් වුවත් ඇමරිකානු අධිරාජ්‍යවාදයට හයිටි ජනතාවට දීමට දෙයක් පරම වසයෙන් ම ඇත්තේ නැත. එම කර්තව්‍යය සඳහා පෙරමුන ගත යුත්තේ දිවයින තුල සහ පිටත සිටින්නන් ද ඇතුලු හයිටි වැඩකරන ජනතාව ද ඇමරිකානු හා ජාත්‍යන්තර කම්කරු පන්තිය ද වෙයි.

ගොඩනැගිලි උපකරන හා නිපුන ගොඩනැගිලි කම්කරුවන් ද හදිසි වෛද්‍ය හා අනෙකුත් කාර්මික සහයෝගය ගොනුකිරීම ද ඇතුලුව හයිටි ජනතාව සඳහා ක්ෂනික සහ සුවිශාල සහන ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් ඉල්ලා සිටිය යුතු ය. අධිරාජ්‍යවාදී බලයන් විසින් සම්පාදනය කරනු නො ලබන මෙම සම්පත් ප්‍රයෝජනයට ගැනීම පවා අර්ධ-අපරාධකාරී හයිටි පාලන තන්ත්‍රයට කල හැක්කක් නො වේ.

හයිටිය යලි ගොඩනැගීම සඳහා කැරිබියානු සහ අන් සියල්ලටමත් වඩා එක්සත් ජනපදය ඇතුලු සමස්ත අර්ධගෝලයේ ම ඔවුන්ගේ පන්ති සහෝදර සහෝදරියන් සමග හයිටියානු කම්කරු පන්තිය එකමුතු කරමින් සමාජවාදී පිලිවෙත් මත කම්කරු පන්තිය ජාත්‍යන්තරව බලමුලුගැන්වීම අවශ්‍ය ය.

පැට්‍රික් මාටින්

© www.wsws.org